පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வடமத்திய மாகாணம
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 7

තෙවන වාර පරීක්ෂණය- 2023

විෂයය :- **ගණිතය**

ඇතුළත්වීමේ අංකය: ..... කාලය : **පැය 2 යි**

I කොටස

- **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

01. $\frac{2}{3}+\frac{1}{6}$ සුළු කරන්න

02. ත්‍රිකෝණයේ පරිමිතිය සොයන්න.



6cm 8mm

03. සමමිතික අක්ෂ 02ක් පමණක් ඇති ද්විපාර්ශ්වික සමමිතික තල රූපයක් ඇඳ, එහි සමමිතික අක්ෂ අඳින්න.

04 P = { "COLOMBO" යන වචනයේ අකුරු } කුලකය, අවයව සඟල වරහන තුල ලියා දැක්වීමෙන් කුලකය දක්වන්න.

05. 81, පාදය ප්‍රථමක සංඛ්‍යාවක් වූ දර්ශක අංකනයෙන් ලියන්න.

06. 20 වන සියවසේ අවසන් දිනය ලියන්න.

[දෙවැනි පිටුව බලන්න.

07. $x = 2$ වන විට, $4x - 3$ හි අගය සොයන්න.

08. රූපයේ ඇති කෝණය නම් කර එය කුමන වර්ගයේ කෝණයක් දැයි ලියන්න.



09. රූපයේ වර්ගඵලය සොයන්න.



10. 3.15 × 6 සුළු කරන්න.

11. දත්ත, ප්‍රස්තාර මඟින් නිරූපනයෙන් ලැබෙන වාසියක් ලියන්න.

12. වෘත්තයේ විශ්කම්භය සොයන්න.



13. අඹ ගෙඩියක ස්කන්ධය 150g ක් නම් එවැනි අඹ ගෙඩි 100ක් ඇති මල්ලක ස්කන්ධය කිලෝග්‍රෑම් කොපමණදැයි නිමානය කරන්න.

[තුන්වැනි පිටුව බලන්න.

14. රූපයේ ඇති ත්‍රිකෝණය, පාදවල දිග අනුව කුමන වර්ගයට අයත් දැයි ලියන්න.



15. $30 + 10 \div 5$ සුළු කරන්න.

16. පාසලේ දැකිය හැකි සමාන්තර රේඛා සහිත වස්තු 02ක් ලියන්න.

17. 538□ යන සංඛ්‍යාව 6න් හා 4න් ඉතිරි නැතිව බෙදේ. හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

18. රූපයේ පරිමාව සොයන්න.



19 $3x - 2 = 13$ සමීකරණය විසඳන්න.

20. $(-8) + (-4)$ සුළු කරන්න.

II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයීම සඳහා වෙනම කඩදාසි භාවිතා කරන්න.**

01. (a) පහත දැක්වෙන්නේ පාසලක අලුතින් ඉදිකිරීමට යෝජිත ආපන ශාලාවක බිම් සැලැස්මේ දළ සටහනකි. එය ඇඳ ඇත්තේ 1 : 200 පරිමාණයටය.



i. D_1 දොරෙහි සැබෑ පළල සොයන්න. (ල .02)

ii. W_3 ජනේලයෙහි සැබෑ දිග සොයන්න. (ල. 02)

iii. සිසුන්ගේ පෙදෙසෙහි සැබෑ දිග සහ පළල සොයා එහි වර්ගඵලය ගණනය කරන්න. (ල.03)

iv. ආපනශාලාවේ සැබෑ පරිමිතිය සොයන්න. (ල. 03)

(b) i. පාදයක දිග 3cm වන සවිධි ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න. (ල .02)

ii. එහි සෑම පාදයක් මතම ෂඩාස්‍රයෙන් පිටතට පිහිටන පරිදි සමපාද ත්‍රිකෝණ නිර්මාණය කරන්න. (ල .02)

iii. එම සමපාද ත්‍රිකෝණ 6හි පිටතට පිහිටි ශීර්ෂ යා කර, ලැබෙන රූපයට නමක් යෝජනා කරන්න. (ල .02)

02. (a) i. පහත පතරම යොදාගෙන සැදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න. (ල. 01)



ii. ඉහත පතරමෙන් සාදන ලද ඝන වස්තුවේ මුහුණත් ගණන, දාර ගණන හා ශීර්ෂ ගණන ලියන්න. (ල. 03)

iii. ඉහත පතරමෙන් සාදා ගන්නා ඝන වස්තු 02ක් ගෙන එහි සමචතුරස්‍ර මුහුණත් 02 එක මත එක සමපාත වන පරිදි අලවා සාදාගන්නා ලද සංයුක්ත ඝන වස්තුවේ දාර ගණන, මුහුණත් ගණන හා ශීර්ෂ ගණන ලියා එය ඔයිලර් සම්බන්ධතාවය සමඟ අනුකූල වන්නේ දැයි බලන්න. (ල. 05)

(b) ඔබ කැමති ශුද්ධ ටෙසලාකරණයක් ඇඳ දක්වන්න. (ල. 02)

03. (a) පසුගිය වසර 04ක අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වල බඩ ඉරිඟු නිෂ්පාදනය පහත බහුතීර ප්‍රස්තාරයෙන් දැක්වේ.



[හයවැනි පිටුව බලන්න.

i. පසුගිය වසර 04 තුල අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ලැබුණු මුළු බඩ ඉරිඟු අස්වැන්න කොපමණද? (ල. 03)

ii. උතුරුමැද පළාතෙහි වැඩිම බඩ ඉරිඟු අස්වැන්නක් ලැබී ඇත්තේ කිනම් වර්ෂයේ ද? එය කොපමණද? (ල. 03)

iii. පසුගිය වසර 04 තුල පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් ලැබුණු බඩ ඉරිඟු අස්වැන්න පිළිබඳව ඔබට කුමක් කිව හැකිද? (ල. 02)

(b) සිසුවෙකු විසින් එක්තරා අහඹු පරීක්ෂණයක් සිදු කිරීම සඳහා යොදා ගැනීමට සකස් කෙරුණු ඝන වස්තුවක පතරම පහත දැක්වේ.



i. මෙම පතරමෙන් සෑදෙන ඝන වස්තුවේ මුහුණතක හැඩයේ නම ලියන්න. (ල. 01)

ii. සිසුවා විසින් ඉහත පතරම භාවිතයෙන් සාදා ගන්නා ලද ඝන වස්තුව සාධාරණ වස්තුවක්ද? නැද්ද? යන්න පැහැදිලි කරන්න. (ල. 02)

04. (a) i. සුදුසු කාටීසිය තලයක් ඇඳ ඒ මත A (5,1) , B (5,3) C(7,2), D (5,6), E (6,5) F(4,10), G (2,5), H(3,6), I(1,2), J(3,3), K(3,1) යන ලක්ෂ්‍ය ලකුණු කර, එම ලක්ෂ්‍ය අනුපිළිවෙලට සරල රේඛා ඛණ්ඩ වලින් යා කර ආරම්භක ලක්ෂය කරා පැමිණෙන්න. (ල. 06)

ii. ඉහත ලැබුණ රූපය සඳහා සුදුසු නමක් යෝජනා කරන්න. (ල. 01)

(b) මල් පාත්තියක දිග එහි පළලට වඩා මීටර 8 ක් වැඩිය.

i. මල් පාත්තියේ පළල මීටර x ලෙස ගෙන එහි පරිමිතිය වන P සෙවීම සඳහා x අඩංගු සූත්‍රයක් ගොඩ නඟන්න. (ල. 02)

ii. එහි පළල 10m නම් එහි පරිමිතිය සොයන්න. (ල. 02)

05. (a) එක්තරා ඉඩමක් මිලදී ගැනීම සඳහා සුනිල්, කමල් හා නිමල් යන මිතුරන් තිදෙනා මුදල් යෙදූ අනුපාතය 2 : 3 : 5 වේ.

i. සුනිල් යෙදූ මුදල රු: 100 000 නම් අනෙක් දෙදෙනා යෙදූ මුදල් වෙන වෙනම සොයන්න. (ල. 04)

ii. තිදෙනා යෙදූ මුළු මුදල සොයන්න. (ල. 02)

(b) සවිනිට නිවසේ සිට පාසලට ඇති දුර 6km කි. ඇය ඉන් $4\frac{1}{2}$ km ප්‍රමාණයක් බසයෙන්ද, ඉතිරි ප්‍රමාණය පයින්ද ගමන් කරයි.

i. ඇය පයින් ගමන් කළ දුර කොපමණද? (ල. 02)

ii. ඇයට 1km ක දුරක් පයින් යෑම සඳහා මිනිත්තු 20ක කාලයක් ගත වේ නම් ඇයට පයින් යන දුර යෑම සඳහා ගතවන කාලය කොපමණද? (ල. 03)

06. එක්තරා දියර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයකට කිරි ගොවින් 04 දෙනෙකු එක් දිනයක ගෙනන ලද දියර කිරි ප්‍රමාණ පහත පරිදි වේ.

මහින්ද	$9l\ 750ml$
සුපුන්	$10l\ 500ml$
ප්‍රියන්ත	$8l$
උපාලි	$11l\ 500ml$

i. ඔවුන් 04 දෙනාම එදින රැගෙන ආ මුළු කිරි ප්‍රමාණය කොපමණද? (ල. 02)

ii. එම ගෙනෙන ලද කිරි ප්‍රමාණය අපතේ නොයන පරිදි $750ml$ බෝතල් වලට ඇසුරුම් කරන ලද්දේ නම් ඒ සඳහා අවශ්‍ය වන අවම බෝතල් ගණන කීයද? (ල. 02)

iii. පුරවන ලද කිරි බෝතලයක ස්කන්ධය 1.2kg වේ. එම පුරවන ලද බෝතල්වල මුළු ස්කන්ධය 65kgට නොවැඩි බව සුපුන් පවසයි. ඔහුගේ ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව සොයන්න. (ල. 03)

iv. කිරි ලීටරයක් සඳහා ඔවුන්ට රු 100ක මුදලක් ලැබෙන්නේ නම් ඔවුන් හතර දෙනාට ලැබෙන මුදල් වෙන වෙනම සොයන්න. (ල. 04)

07. (a) සිංහපුර කණිෂ්ඨ විදුහලේ චාරිකාවක් සංවිධානය කළ සංවිධායක මණ්ඩලය එහි මුළු වියදමින් $\frac{3}{5}$ ක් බස් රථ සඳහාද, 15%ක් ආහාර සඳහා ද, 0.25ක් නවාතැන් සඳහා ද වැය වන බව ඇස්තමේන්තු කරන ලදී.

i. බස්රථ හා නවාතැන් සඳහා වැයවන මුදල් මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස වෙන වෙනම දක්වන්න. (ල. 04)

ii. චාරිකාවේ වැඩිම වියදමක් දැරීමට සිදුවන්නේ කුමන් කාර්යයට දැයි පැහැදිලි කරන්න. (ල. 02)

(b) කටියාව ගම්මානයට මාළු වෙළෙන්දෙක් දින 3කට සැරයක් ද, යකඩ බඩු එකතු කරන්නෙක් දින 4කට සැරයක් ද, අයිස්ක්‍රීම් වෙළෙන්දෙක් දින 2කට සැරයක් ද පැමිණේ.

ඔවුන් තිදෙනාම එකවර 2024 පෙබරවාරි 25 වන දින ඉරිදා ගමට පැමිණියේ නම් නැවත වතාවක් තිදෙනාම එකවර ගමට පැමිණෙන ආසන්නම දිනය, දවස සමඟ සඳහන් කරන්න (ල. 05)

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வடமத்திய மாகாணம
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 7

තෙවන වාර පරීක්ෂණය- 2023

විෂයය :- **ගණිතය**

පිළිතුරු පත්‍රය

ඇතුළත්වීමේ අංකය: ..... කාලය : පැය 2 යි

I කොටස

01. $\frac{2}{3} + \frac{1}{6}$
$= \frac{2 \times 2}{3 \times 2} + \frac{1}{6}$ ←①
$= \frac{4}{6} + \frac{1}{6}$
$= \frac{4 + 1}{6}$
$= \frac{5}{6}$ ←①

02.
cm	mm
6	8
6	8
+ 6	8
20cm	4mm

←②

03. ගැළපෙන රූපයට ←①
සමමිතික අක්ෂ ගණන ←①

04. P = { C , O , L , M , B } ←②

05. 3 | 81
3 | 27
3 | 9
3 | 3
1

$81 = 3 \times 3 \times 3 \times 3$
$81 = 3^4$
←②

06. 2000 - 12 - 31

07. 4x - 3
x = 2 වේ
= 4 × 2 - 3 ←①
= 8 -3
= 5 ←①

08. $P\hat{Q}R$ ←①
මහා කෝණයකි ←①

09. 

$27cm^2$ ←②

10. 3.15
× 6
18.90 ←②

11. ගැළපෙන පිළිතුරට ලකුණු 02ක් ලබා දෙන්න.

12. 4cm × 2 = 8cm ←②

13. 150 × 100
= 15 000g
= 15 kg ←②

14. විෂම ත්‍රිකෝණය

15. 30 + 10 ÷ 5
= 30 + 2 ←①
= 32 ←①

16. ගැළපෙන පිළිතුරු 02ට ලකුණු 02ක් ලබා දෙන්න.

17. 538 [8] ←②

18. 2cm × 3cm × 4cm ←①
= $24cm^3$ ←①

19. 3x - 2 = 13
= 3x = 13 + 2
= $\frac{3x}{3} = \frac{15}{3}$ ←①
x = 5 ←①

20. (-8) + (-4)
= (-12) ←②

පිළිතුරු පත්‍රය

II කොටස

01. a) 1 : 200
1cm : 200cm
1cm : 2m

i. 0.5 × 2 ←①
= 1m ←①

ii. 1.2 × 2 ←①
= 2.4m ←①

iii. සැබෑ දිග = 3.5 × 2
= 7m ←①
සැබෑ පළල = 2 × 2
= 4m ←①
වර්ගඵලය = 7 × 4
= $28m^2$ ←①

iv. 6 + 4 + 6 + 4 = 20cm ←①
= 20 × 2 ←①
= 40m ←①

b) i. ←②
ii. ←②



iii. සවිධි ෂඩාශ්‍රය ←②

02. a) i. සමචතුරස්‍ර පිරමීඩය ←①

ii. මුහුණත් = 05 ←①
දාර = 08 ←①
ශීර්ෂ = 05 ←①

iii. මුහුණත් + ශීර්ෂ = දාර + 2 ←①
ගණන ගණන ගණන
8 + 6 = 12 + 2 ←②
14 = 14 ←②

b) i. ගැළපෙන නිර්මාණයට ලකුණු 02ක් ලබා දෙන්න.

03. a) i. 2019 - 5500
2020 - 6000
2021 - 6000
2022 - 4000
21500t ←③

ii. 2019 - 12500t
2020 - 12000t
2021 - 11500t
2022 - 9000t
2019 වර්ෂයේ ←③

iii. වසරින් වසර අඩු වී ඇත. ←②

b) i. සමචතුරස්‍රය ←①

ii. සාධාරණ වස්තුවක් වේ ←②
සියලු පැති සමාන වේ.

04. a) i. ←⑥



ii. ගස ←①

b) i. දිග = x + 8
P = x + x + 8 + x + x + 8
= 4x + 16 ←②

ii. P = 4 × 10 + 16
= 40 + 16
= 56m ←②

05. a) i. සුනිල් : කමල් : නිමල්
2 : 3 : 5
10000 :

කොටස් 2ක වටිනාකම = 100000
කොටස් 1ක වටිනාකම = 100000 ÷ 2
= 50000
කමල් යෙදවූ මුදල = 50000 × 3
= රු. 150000 ←②
නිමල් යෙදවූ මුදල = 50000 × 5
= රු. 250000 ←②

ii. මුළු මුදල = 100000 + 150000 + 250000
= රු. 500000 ←②

b) i. $6 - 4\frac{1}{2}$

$= 1\frac{1}{2}$ km ←②

ii. 1km යාමට කාලය = මි. 20
$1\frac{1}{2}$ km යාමට කාලය = $20 \times 1\frac{1}{2}$

$20 \times \frac{3}{2}$

මි.30 ←③

---

06. i.

l	*ml*
9	750
10	500
8	000
+ 11	500
39l	*750ml* ←②

ii. 39750 ÷ 750 ←①
= 53 ←①

iii. 53 × 1.2 ←①
= 63.6 kg ←①
63.6 kg < 65 kg
සත්‍ය වේ. ←①

iv. මහින්දට - රු. 975.00 ←①
සුපුන්ට - රු. 1050.00 ←①
ප්‍රියන්තට - රු. 800.00 ←①
උපාලිට - රු. 1150.00 ←①

07.a) i. බස් රථ සඳහා = $\frac{3 \times 20}{5 \times 20} = \frac{60}{100}$

= 60% ←②

නවාතැන් සඳහා = 0.25 = $\frac{25}{100}$

= 25% ←②

ii. බස් රථ සඳහා ←①
වැඩි ප්‍රතිශතයක් වෙන් වීම ←①

මාළු දින 03ට
යකඩ බඩු දින 04ට
අයිස්ක්‍රීම් දින 02ට

කු.පො.ගු. = 12 ←③

2024 මාර්තු 08 සිකුරාදා ←②